## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්මේන්තුව

නිවාඩු කාලීන පැවරුම් - සැප්තැම්බර් මාසය - දෙවන සතිය

විෂය සමගාමී ක්‍රියාකාරකම්

3 ශ්‍රේණිය - මව්බස

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

ආදරණීය දුවේ, පුතේ

- ❖ මතකද වරුණි, මනුක, තරිඳු, රවිඳු, නිසල් ඇතුළු යාළුවො කට්ටිය ගුරුතුමියත් එක්ක මුහුදු වෙරළට චාරිකාවක් ගියා.
- ❖ මනුකයි තරිඳුයි වෙරළෙ වැලි මාලිගාවක් හැදුවා
- ❖ වරුණි ලස්සන ලස්සන සිප්පි කටුවලින් මාළිගාව සැරසුවා.
- ❖ වෙරළ අයිනෙ දම්පාට බිම් තඹුරු මල් පිපි තිබුණා.
- ❖ ධීවර බෝට්ටු, ධීවර ආම්පන්න වැටකෙයියා ගාලෙන් ආරක්ෂා වුණු වෙරළෙ පිරිල තියෙනවා.

දුවේ, පුතේ

- ➢ අපි ලෑලි කැබැල්ලක් අරගෙන මැටි ටිකක් අනලා මුහුදු වෙරළක් නිර්මාණය කරමු.
- ➢ මනුකලා දුටු ඒ මුහුදු වෙරළ මේ කොරෝනා කාලෙ ආරක්ෂා වෙලා අපි ගෙදර නිර්මාණය කරමු.
- ➢ ලස්සනට හදලා ඔයාලගෙ ගුරුතුමීටත් ෆොටෝ එකක් යවමු නේද?

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්මේන්තුව

නිවාඩු කාලීන පැවරුම් - සැප්තැම්බර් මාසය - සිව්වන සතිය

විෂය සමගාමී ක්‍රියාකාරකම්

3 ශ්‍රේණිය - ගණිතය

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

<u>දිග මනිමින් සෙල්ලම් කරමු.</u>

අවශ්‍ය ද්‍රව්‍ය

- මීටර කෝදුවක් හෝ මීටරයක් දිග කෝදුවක්
- බෝලයක්

දුවේ, පුතේ

- මෙම ක්‍රියාකරකම සදහා නිවසේ තවත් වැඩිහිටියෙකුගේ සහාය ලබා ගන්න.
- මුලින්ම මිදුලේ සළකුණු කළ එක් ස්ථානයක සිට බෝලය වේගයෙන් ඉදිරියට බිම දිගේ තල්ලු කරන්න.
- දැන් ඔබ දෙදෙනාම සළකුණු කළ ස්ථානයේ සිට බෝලය ඇති තැනට දුර නිමානය කරන්න. (සිතන දුර ප්‍රකාශ කරන්න.)
- දැන් මීටර කෝදුව භාවිතයෙන් නිවරදිව දුර මනින්න.
- සිතූ දුර හා හැබෑ දුර නිවරදිව හෝ ආසන්න වශයෙන් ප්‍රකාශ කළ කෙනාට ජයග්‍රහණය හිමිවේ.

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්මේන්තුව**

නිවාඩු කාලීන පැවරුම් - සැප්තැම්බර් මාසය - පළමු සතිය

සුලග ඇති වේලාවක් මිදුලට ගොස්...

විෂය සමගාමී ක්‍රියාකාරකම්

3 ශ්‍රේණිය - පරිසරය

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

දුවේ, පුතේ

- සුළඟ ඇති වෙලාවක මිදුලට යන්න.
- පහත කවිය ගායනා කරමින් නිදහසේ සුළඟ නිසා පරිසරයේ සිදුවන දේ නිරීක්ෂණය කරන්න.

හෙමින් හෙමින් එන සුළඟට

ගස්වල කොළ පාවෙනවා

සිත ගත දෙක සනසවමින්

මල් සුවදත් එක් වෙනවා

- සුළඟ සමග විනෝද වන්න. ගතට සිතට දැනෙන සිසිලස අත් විදින්න.
- ඔබත් සුළඟ පිළිබද කවියක් නිර්මාණය කරන්න.

**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්මේන්තුව**

නිවාඩු කාලීන පැවරුම් - සැප්තැම්බර් මාසය - තුන්වන සතිය

අහස බලමු. චිත්‍ර අදිමු.

විෂය සමගාමී ක්‍රියාකාරකම්

3 ශ්‍රේණිය - පරිසරය

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

දුවේ, පුතේ

## අහස බලමු - චිත්‍ර අදිමු.

- සතියේ ඔබ කැමති දිනයක දිවා අහස හොදින් නිරීක්ෂණය කරන්න.

  (හිරු පවතින් ආකරය, වැසි සහිත හවසක් ද යන බව, වළාකුළු සහිත බව, අහසේ වෙනත් දැකිය හැකි දෑ)

- A4 කොළයක් ගෙන ඔබ දුටු " දිවා අහස" චිට්‍රයට නගන්න. ලස්සනට පාට කරන්න.
- එදිනම රාත්‍රී අහසද හොදින් නිරීක්ෂණය කරන්න.

  ( සඳ, තරු, නිශාචර සතුන්... වැනි)

- A4 කොළයක් ගෙන ඔබ දුටු "රාත්‍රී අහස" චිත්‍රයට නගන්න. ලස්සනට පාට කරන්න. දිනය ද යොදන්න.
- චිත්‍ර දෙකම එකට අමුණා පාසල ආරම්භක වූ පසු ගුරුතුමාට / ගුරුතුමියට බාර දෙන්න.